# නාගරික සංවර්ධනය හා ආර්ථිකය



මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන

හැඳින්වීම.

නාගරිකරණය යනු යම් රටක හෝ ප්‍රදේශයක ජීවත් වන ජනයාගෙන් නගර ලෙස අර්ථ දක්වන ප්‍රදේශවල කොපමණ ජනගහනයක් ජීවත්වේද යන්නයි.ලොව සෑම රටකම නාගරිකරණය හඳුනා ගනු ලබන්නේ එකම නිර්ණායකයක් පදනම් නොවන බවය.ලෝකයේ ඇතැම් රටවල් යම් ජනාවාසයක අර්ථකථනය කරයි.තවත් රටවල් යම් ජනාවාසයක ජනගහනය සමඟ එම ජනකායෙන් කොපමණ ප්‍රතිශතයක් කෘෂි නොවන ආර්ථික ක්‍රියාවල නිරතවනවාද යන්න සලකයි.ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට මෙරට නාගරිකරණය තිරණය කරනුයේ පරිපාලන කාර්යය පදනම් කරගනිමිනි.

අද වන විට ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් දියුණු කිරිම ඔස්සේ නාගරික ග්‍රාමීය විෂමතාව අවම කිරිමට උත්සුක වන අතර කලකට ඉහතදී වෙනස් කළ ශ්‍රී ලංකාවේ අගනගරය හා සම්බන්ධ නේවාසික හා පරිපාලන කෘත්‍ය ඕනෑම සමාජයක කෙටි කාලින හා දිගුකාලින වශයෙන් වෙනස් විමට ලක්වේ.(දිගු කාලින සමාජ වෙනස් විම කාරක හයක් පදනම් කරගනිමින් සිදු වේ.)එනම් කාර්මිකරණය නවිකරණය නාගරිකරණය වාණිජකරණය බටහිරකරණය හා ගෝලියකරණයයි.

රටක නාගරිකරණයේ තත්ත්වය නොඑසේ නම් එහි ස්වාභාවය එරට ආර්ථික සංවර්ධන සහ පුද්ගලයන්ගේ ජිවන තත්ත්වය වඩාත් හොඳින් නිරූපණය කරන ආදර්ශයකි.

මානව ජන ජීවිතයට, වඩාත් යහපත් වටපිටාවක් නිර්මාණය කිරීම සියලු සංවර්ධන උපාය මාර්ගයන්හි අරමුණ වේ. නාගරීකරණ සංකල්පය ද එම අරමුණ උදෙසා නිර්මිත ජනාවාසවල කාලීන අවකාශීය වෙනස්කමක් වේ. එහෙත් අද වන විට ලෝකයේ ජනාවාස ධූරාවලියේ නාගරික ජනාවාස වඩාත් ගතික මෙන් ම ආර්ථික සහ සාමාජීය මර්මස්ථානයක් බවට ද පත් වෙමින් තිබේ. සංවර්ධනය සම්බන්ධයෙන් හඳුනාගන්නා නිර්ණායකයන් තුළ නාගරීකරණය සුවිශේෂී ස්ථානයක් ගනී. සැලසුම් සහගත නාගරීකරණය රටක සමාජ, ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපාන අතර වඩා සංවිධානාත්මක ජනාවාසකරණය හා පශ්චාත් ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි, විශේෂයෙන් සේවා ආර්ථිකය පවත්වාගෙන යැමට, පසුබිම නිර්මාණය වීමට ආදි වශයෙන් වර්තමානයට මෙන් ම අනාගතයට නාගරීකරණය අවශ්‍යම ක්‍රියාවලියක් වේ.

විධිමත් අර්ථකථනයක් ඔස්සේ හඳුනාගත් විට නාගරීකරණය යනු යම් රටක හෝ ප්‍රදේශයක හෝ ජීවත් වන ජනයා ගෙන් නගර ලෙස අර්ථ දක්වන ප්‍රදේශවල කොපමණ ජනගහනයක් ජීවත් වේ ද යන්නයි. ඒ සමඟ ම පැහැදිලි කරගත යුතු කරුණ වනුයේ ලොව සෑම රටක ම නාගරීකරණය හඳුනාගනු ලබන්නේ එක ම නිර්ණායකයක් පදනම් කරගෙන නො වන බව ය. ලෝකයේ ඇතැම් රටවල් යම් ජනාවාසයක ජනසංඛ්‍යාව පදනම් කරගෙන නාගරික ජනාවාස අර්ථකථනය කරයි (උදා (- ඇමෙරිකා එක්සත් ජනපදය, ආජන්ටිනාව). තවත් රටවල් යම් ජනාවාසයක ජනගහනය සමඟ එම ජනකායෙන් කොපමණ ප්‍රතිශතයක් කෘෂි නො වන ආර්ථික ක්‍රියාවල නිරත වනවා ද යන්න සලකයි (ඉන්දියාව). ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට මෙරට නාගරීකරණය තීරණය කරනුයේ පරිපාලන කාර්ය පදනම් කරගනිමිනි. ඒ අනුව නගර සභා හෝ මහනගර සභා යටතේ පාලනය වන ප්‍රදේශවල කොපමණ ජනසංඛ්‍යාවක් වාසය කරයි ද යන්න මත නාගරීකරණය තීරණය කෙරෙයි. විස්තෘථාර්ථයෙන් මේ සම්බන්ධයෙන් හඳුන්වන ලද්දේ, මේ විග්‍රහය තුළ ශ්‍රී ලංකාවේ මේ පරිපාලනමය නාගරීකරණ අර්ථකථනය පදනම් වූ නාගරීකරණය පිළිබඳ ව සුවිශේෂී ව විස්තර කෙරෙන බැවිනි.

නාගරික සංවර්ධනය යන්න, නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජ, පාරිසරික සහ භෞතික සංර්ධනයේ ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම යනුවෙන් පුළුල් වශයෙන් නිර්වචනය කළ හැක. මෙය 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ ප්‍රකාශිත වේ. තවද, නාගරික සංවර්ධනය යන්න, කර්මාන්ත සඳහා උචිත යටිතල පහසුකම් සැපයීම සහ ශක්තිමත්

කිරීම මගින් කාර්මිකකරණය සඳහා වන උපාය මාර්ගයක් පැහැදිලි ලෙස ප්‍රකාශ කරන්නක් වශයෙන් ද අර්ථ දැක්විය හැක. භෞතික යටිතල නිර්මිතියක සැලසුම් සහගත ආකාරයෙන් ආයෝජනය කිරීම ඇත්ත වශයෙන්ම නාගරික සංවර්ධනයට මූලික වන කරුණකි.

01.නාගරික අංශයේ වයස 18 වැඩි ජනගහනය.

වයස 18 වැඩි ජනගහනය-2018

| දර්ශකය | නාගරික |
|---|---|
| 18 ට වැඩි ජනගහනය | 2,662,659 |
| ශ්‍රම බලකාය වයස් කාණ්ඩය අනුව | 1,402,038 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | 52.7 |
| රැකියා ගත ජනගහනය | 1,345,361 |
| සේවා නියුක්තිය  අනුපාතය | 96 |
| විරැකියා ජනගහනය | 56,677 |
| විරැකියා අනුපාතය | 4 |
| ශ්‍රම බල සහභාගිත්වය නොමැති | 1,260,621 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018

නාගරික අංශයේ වයස 18ට වැඩි ජනගහනය 2,662,659  කී.ශ්‍රම බලකාය 1,402,038 ලෙස දැක්වේ.

02.2018 වර්ෂයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය(ස්ත්‍රී පුරුෂ භාවය/වයස් කාණ්ඩ)

| වයස් කාණ්ඩය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය% | | |
|---|---|---|---|
| | සමස්ත | ස්ත්‍රී | පුරුෂ |
| නාගරික | 49.6 | 72 | 30 |
| 15-19 | 11.1 | 17.2 | 5.4 |
| 20-24 | 53 | 70.2 | 36.7 |
| 25-29 | 68.9 | 92.5 | 43.9 |
| 30-39 | 67.4 | 96.5 | 42.2 |
| 40+ | 47.9 | 71.9 | 27.9 |


ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018

2018 වර්ෂයේ ශ්‍රම බලකා සහභාගිත්වය සලකා බැලූ විට 30-39 වයස් කාණ්ඩයේ ස්ත්‍රී ජනගහනය වැඩි වී ඇති බවක් දක්නට ලැබේ.එය 96.5%කි.25-29 වයස් කාණ්ඩය ස්ත්‍රී පුරුෂ සහභාගිත්වය වැඩි වී ඇත.68.9% කි.

## 03.ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය ස්ත්‍රී පුරුෂභාවය හා අංශ අනුව-2018

| | නාගරික% |
|---|---|
| ස්ත්‍රී | 32.2 |
| පුරුෂ | 67.8 |

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018





ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018

නාගරික අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය සලකා බැලූ විට,පුරුෂ ජනගහනය වැඩි බවක් දක්නට ලැබේ.67.8% කී.එය සංඛ්‍යාත්මකව දැක් වූ විට පුරුෂ 956,535 කි.ස්ත්‍රී 455,260 වේ.

## 04. ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන ජනගහනය ස්ත්‍රී පුරුෂභාවය හා අංශ අනුව-2018

| අංශය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| නාගරික | 1,434,306 | 100 | 371,678 | 25.9 | 1,062,628 | 74 |
| | | | | | | |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018





ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018

ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන ජනගහනය සලකා බැලූ විට ස්ත්‍රී ජනගහනය වැඩි බව පෙනි යයි.74% කී.පුරුෂ ජනගහනය 25.9% කී.

## 05. රැකියා ගත ජනගහන අනුපාතය ස්ත්‍රී පුරුෂභාවය හා අංශ අනුව- 2018

| අංශය | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| නාගරික | 47.6 | 69.6 | 28.3 |
| | | | |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018





ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018

රැකියාගත ජනගහන අනුපාතය සලකා බැලූ විට පුරුෂ ජනගහනය වැඩි බව දක්නට ලැබේ.69.6% වේ.ස්ත්‍රී ජනගහනය 28.3% කි.

## 06.විරැකියා සංඛ්‍යාව සහ විරැකියා අනුපාතය ස්ත්‍රී පුරුෂභාවය හා අංශ අනුව 2018

| ස්ත්‍රී/පුරුෂභාවය | නාගරික |
|---|---|
| පුරුෂ | 32,542 |
| | 3.4 |
| ස්ත්‍රී | 25,881 |
| | 5.7 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018




ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018

විරැකියා සංඛ්‍යාව සහ අනුපාතය සලකා බැලූ විට ස්ත්‍රී අනුපාතය හා සංඛ්‍යාව වැඩි බවක් දක්නට ලැබේ.එය 25,881 කි. අනුපාතය 5.7% කි.පුරුෂ ජනගහනය 32,542 කි.අනුපාතය 3.4කි.

## 07.මධ්‍යනාය සහ මධ්‍ය මාසික ආදායම(තමන්ගේම සේවකයකු සහ සේවකයින්)අංශ අනුව

| වර්ෂය | මිනුම් | මාසික ආදායම)Rs) |
|---|---|---|
| | | නාගරික |
| 2018 | මධ්‍යනාය | 78,933 |
| | මධ්‍ය | 30,000 |
| | | |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018

මාසික වැටුප් අගයන් සහ සේවා යෝජකයින් න්‍ය හා මධ්‍යනාවැටුප් සඳහා ඇස්තමේන්තුගත මධ්‍ය / ආදායම සහ තමන්ගේම ගිණුම් සේවකයින් සඳහා අංශ අනුව ස්වයං වාර්තා කළ තනි දැක්වේ.

## 08.ප්‍රධාන කර්මාන්ත කණ්ඩායම් විසින් සේවා නියුක්ත ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය-2018

| අංශය | එකතුව | ප්‍රධාන කර්මාන්ත කණ්ඩායම | | |
|---|---|---|---|---|
| | | කෘෂිකර්මාන්තය | කර්මාන්ත | සේවා |
| නාගරික | 100 | 4.4 | 25.5 | 70.1 |
| | | | | |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-2018


නාගරික අංශයේ ප්‍රධාන කර්මාන්ත අතුරින් සේවා අංශයේ සේවා නියුත්ත ජනගහනය වැඩි බවක් දක්නට ලැබේ.70.1% වේ.කර්මාන්ත අංශය දෙවෙනි ස්ථානය ගනී.25.5% වේ.

## 09.සේවා නියුක්තිය කෙරෙහි කර්මාන්ත අංශයේ දායකත්වය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් කාර්මික අංශයට සේවා නියුක්තිකයන්ගේ වන දායකත්වය ප්‍රතිශතයක් ලෙස (නාගරික අංශයන්)

| වර්ෂය | නාගරික% |
|---|---|
| 2010 | 24.7 |
| 2012 | 26.7 |
| 2013 | 27.2 |
| 2014 | 26.5 |
| 2015 | 26.6 |
| 2018 | 25.5 |

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා




ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018

ශ්‍රී ලංකා ශ්‍රම බලකායෙන් කාර්මික අංශයට සේවා නියුක්තිකයන්ගෙන් වන දායකත්වය නාගරික අංශයෙන් විමසා බලන විට 2018 වර්ෂයේ පසු බැමක් දක්නට ලැබේ. එය 25.5% කී.

## නිගමණ

01.නාගරික අංශයේ වයස 18 ට වැඩි ජනගහනය 2,662,659 වේ.ශ්‍රම බලකාය 1,402,038 වේ.

02.ශ්‍රම බලකා සහභාගිත්වය 30-39 ස්ත්‍රි ජනගහනය වැඩි වේ.96.5% කි.25-29 ස්ත්‍රි පුරුෂ සහභාගිත්වය වැඩි වි ඇත.68.9කි.

03.ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය පුරුෂ ජනගහනය වැඩි වේ.956,535කි.67.8% වේ.ස්ත්‍රි 455,260 වේ.32.2% වේ.

04.ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන ජනගහනය ස්ත්‍රි ජනගහනය වැඩි වේ.74% වේ.1,062,628 වේ.පුරුෂ ජනගහනය 25.9% කි.371,678කී.

05.රැකියා ගත ජනගහනය පුරුෂ ජනගහනය වැඩිවේ.69.6% වේ.ස්ත්‍රි ජනගහනය 28.3%කි.

06.විරැකියා සංඛ්‍යාව ස්ත්‍රි අනුපාතය සහ සංඛ්‍යාව වැඩි බව දක්ට ලැබේ.25,881 සහ 5.7%. වේ.

07. 2018 වර්ෂයේ නාගරික අංශයේ සේවා නියුක්තියේ පසුබැමක් දක්නට ලැබේ.25.5.%කි.

## යෝජනා

01.නාගරික අංශයේ ස්ත්‍රි විරැකියා සංඛ්‍යාව වැඩි බවක් දක්නට ලැබෙන අතර පුරුෂයන් හා සමාන තත්ත්වයක් ඇති කිරිමට කටයුතු කළ යුතු වේ.

02.කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්තිය 4.4%කි.කර්මාන්ත හා සේවා අංශයන්ට සාපේක්ෂව කෘෂිකර්මාන්තයේ අඩවිමක් දක්නට ලැබේ.කෘෂිකර්මාන්තය සේවා නියුක්තිය නැංවිමට කටයුතු සැලැස්විය යුතු වේ.